# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1957/17 - 2016 මාර්තු මස 09 වැනි බදාදා - 2016.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

ව්‍යවස්ථාපිත නිශ්වය අංකය :-2515

විශේෂ අංකය :- මහ/167

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්වයේ අඩුව සම්පූර්ණ කිරීම**

තිස්පනේ, නාවලපිටියෙහි පදිංචි ජයවීර කරුණාරත්න මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලදින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටසින් කොටසක් නිශ්වය කරමින් අංක 227/5 හා 1971.08.25 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ව්‍යවස්ථාපිත නිශ්වය අංක 2515 යටතේ පළ කර ලබාදී ඇත. එලෙස ලබාදී ඇති ව්‍යවස්ථාපිත නිශ්වයේ අඩුව සම්පූර්ණ කිරීම සඳහා ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තවදුරටත් තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 මාර්තු මස 07 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ,
අංක සී 82 හි දී ය.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ පස්බාගේ කෝරලේ සුළු කොට්ඨාසයේ කඩියන්ලෙන යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු අංක මහ 959 හි දක්වෙන කඩියන්ලෙන වත්ත නැමති ඉඩමේ කැබලි අංක 05 සහ 06 දරන බිම් කැබලි වලින් නිරූපිත අක්. 03 රූඩ්. 2 පර්. 14 ක් වන බිම් කොටස සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද වේ.

03 - 614/1


1A - G 23109 — 16 (2016/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය :-4637

විශේෂ අංකය :- ර/227

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

ඕමල්පේ, දියපොට ''ලීලා නිවස'' හි පදිංචි දියෝනිස් අප්පුහාමි රාජපක්ෂ දිසානායක මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලද අතර මේ වන විට ඔහු මියගොස් ඇති බැවින්, පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩ දිය යුතු කොටස් නිශ්චය කරමින් ඔහුගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 මාර්තු මස 07 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ,
අංක සී 82 හි දී ය.

## උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියපොටගම් පත්තුව සුළු කොට්ඨාසයේ අංක 217A කැම්පනේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගොඩවෙල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද ගම් පිඹුරු අංක 759 හි අතිරේක අංක 35 හි දැක්වෙන කැතිගාවතැන්න වත්ත නැමති ඉඩමේ කැබලි අක්. 16 රූඩ්. 0 පර්. 17.12 ක ප්‍රමාණය ඇති කැබලි අංක 391, 394, 395, 396, 401 සහ 402 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ පළතුරු හා ගොඩනැගිලි ද වේ.

03 - 614/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.